# 11 කලා වැවට පින් දීලා පලයල්ලා

**ගොවිතැන ජීවනෝපාය කර ගත් ලාංකික ජනයාට ජලය ඒ සඳහා අත්‍යවශ්‍ය විය. වැසි දිය පමණක් ඊට ප්‍රමාණවත් නොවූ නිසා ජලාශ තනා ජලය රැස් කර ගැනීමට ඔවුහු පෙලඹුණහ. වැව් නිර්මාණය වූයේ එහි ප්‍රතිඵලයක් වශයෙනි. වැව යනු ලාංකික අපට ම ආවේණික වූ වාරි තාක්ෂණික අංගයකි. ආර්. එල්. බ්‍රෝහියර් නමැති ඉංග්‍රීසි ජාතිකයා විසින් රචනා කළ The Seening Ceylon කෘතියේ බ්‍රෝහියර් දුටු ලංකාව නමින් (අභය හේවාවසම් මහතා විසින් කරන ලද සිංහල පරිවර්තනය) ඇසුරෙන් ලියැවී ඇති මෙම පාඩමට කලා වැව සම්බන්ධ තොරතුරු පාදක වී ඇත.**

ලංකාවේ වැව් හා සබැඳි මනහර ජනප්‍රවාද වේ. කලාවැව සම්බන්ධයෙන් ප්‍රචලිත ව පවතින ජනප්‍රවාදයක් මෙසේ ය.

ඈත අතීතයේ දී අනුරාධපුරයේ කඩවර නම් මිනිසෙක් වූයේ ය. මොහු සිය භාර්යාවගේ කෙනෙහිලිකම්වලින් බේරීමට මහා වනාන්තරයට ගියේ නිවී සැනසිල්ලේ සතුටින් ජීවත් වීමට ය. මෙම සිදුවීමෙන් දොළොස් වසරකට පසුව රජ වාසලට මුව මස් සැපයූ මස් වැද්දා රජතුමාට වාර්තා කළේ නගරයෙන් පැන ගොස් කැලෑවේ ජීවත් වන මිනිසෙකු මහා නිධානයක් රැක ගෙන සිටින බවයි.

මේ පුවතින් කැලඹුණු රජු නගරයේ ගිනිකොන දිගට සැතපුම් 25ක් ඈතින් පිහිටා තිබූ මෙම ස්ථානයට ගියේ ය. ගොස් කඩවර නැමැති මිනිසා අත්අඩංගුවට ගෙන තමා අබියසට කැඳවා නිධානය පිළිබඳ ප්‍රශ්න කෙළේ ය. ඔහු කියා සිටියේ කල වැල් ගොන්නකින් බැස යන මාර්ගය ඇහිරී තිබෙන නිසා, ජලය එක් රැස් වී සැතපුම් ගණනාවක් ඈතට පැතිර තිබෙන ජලාශයක් මිස තමන් දන්නා වෙනත් නිධානයක් නොමැති බවයි.

මෙහි ස්ථිර ජලාශයක් බිහි කිරීමේ හැකියාව දුටු රජතුමා ඉතා ප්‍රීතියට පත් ව කලා වැව නිර්මාණය කෙළේ ය. මේ මහා වාරි කර්මාන්තය නිම වූ පසු එය බලා ගැනීමට රජතුමා විසින් කඩවර පත් කරන ලදි.

එක් දිනක මහා වර්ෂාවකට පසු ව මේ වැවේ ජලය කාන්දු වන්නට විය. මේ ජල කාන්දුව වහා ම නැවැත්වූයේ නැත්නම් වැව් බැම්ම එතැනින් කැඩී යාමට ඉඩ ඇති බව කඩවර දුටුවේ ය. මේ කාන්දුව නවත්වා ගැනීමට අන් ක්‍රමයක් නුදුටු කඩවර ජලයට බැස තම සිරුර ඒ කාන්දු වන ස්ථානයට තබා තද කරමින් ජල කාන්දුව නැවැත්වී ය. මේ ක්‍රියාවේ දී ඔහු මිය ගිය නමුදු මේ කැපවීමේ පින් මහිමය නිසා හේ කඩවර දෙවියන් නැතහොත් කලා වැව අධිගෘහීත දෙවියන් හැටියට උපන්නේ ය.

මේ කතාව පැරැන්නන් කොපමණ ඇදහුවේ ද යත් පැරණි වාන උඩ කඩවර දෙවියන් වෙනුවෙන් කැප වූ දේවාලයක් ද ඉදි කෙරිණි. ලංකාව බතින් බුලතින් පෝෂණය කිරීමට අධිෂ්ඨාන කරගත් පාලකයෙක් පස්වන සියවසේ දී කලා වැව හා බලලු වැව යන වැව් යුගල එක් කර විශාල ජලාශයක් ඉදි කෙළේ ය. ඒ ධාතුසේන රජු ය. මෙසේ විශාල ජලාශයක් කළ රජතුමා, එම ජලය අඩි 40ක් පමණ පළල යෝධ ඇළ ඔස්සේ සැතපුම් 54ක් දුර ඇති අනුරාධපුරයට ගෙන ගියේ ය. සියවස් දහසයකට පෙර එබඳු මහා පරිමාණයේ ඇළක් එවන් භූමි භාගයක නිර්මාණය කළේ කෙසේ ද යන්න විමතියට කරුණකි. පළමු සැතපුම් දාහතේ දී එය සෙමෙන් ඇදී යන්නේ සැතපුමට අඟල්



කලා වැව



වැව් බැම්ම



වර්තමාන කඩවර දේවාලය



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

හයක් පමණ බැවුමක් ඇති ව ය. ධාතුසේන රජු විසින් කලා ඔය නිම්නයේ පුරාතන ඉංජිනේරුවන් ලවා කරවූ මේ විශ්වකර්ම නිර්මාණයට අමතරව තවත් විශිෂ්ට පුරුකක් මෙයට එක් කළේ ය. එනම් වාරි මාර්ග මගින් ජලය සැපයිය හැකි වර්ග සැතපුම් 18ක වපසරියක් තුළ කුඩා ග්‍රාමීය වැව් 100ක් ඉදි කර ඒ සීමාව තුළ අංග සම්පූර්ණ වාරි මාර්ග පද්ධතියක් බිහි කිරීමයි.

අදට ද කලා වැවට නුවර කලාවිය වැසියෝ ගරු බුහුමන් දක්වති. මෙබඳු ජන කවියක් ඔවුන් අතර පවතින්නේ එබැවිනි.

**"කලා වැවෙන් දිය දෝතක් බීපල්ලා**
**කලා වැවට පින් දීලා පලයල්ලා"**

ලංකාවේ විශිෂ්ටතම වාන පිහිටා ඇත්තේ කලා වැවේ ය. මෙය කළුගල කපා සාදා ඇත. මේ වාන මෑත කාලයන්හි ප්‍රතිසංස්කරණයෙහි දී පවා එසේ ම තිබෙන්නට ඉඩ හැර ඇත. මෙය අඩි 216ක් පළල අඩි 170ක් දිගු එකකි. මෙය එකල නිර්මාණය කෙරුණු පුදුමාකාර නිර්මාණයකි. එකල සිටි ශිල්පියාගේ ඉවසිලිවන්තකමත් දක්ෂ බවත් මින් පිළිඹිඹු කෙරේ. විසල් වැවක තවත් වැදගත් අංගයක් ලෙස රළපනාව හඳුන්වා දිය හැකි ය. මෙය, දිය රැලි වැවේ ඇතුළු බිත්තියේ වැදීමෙන් හානි පැමිණීම වැළැක්වීම සඳහා යොදාගෙන ඇත්තකි. දිය රැල්ලෙන්



වාන



රළපනාව



බිසෝකොටුව

වැව් බැම්ම ආරක්ෂා වීම මෙම නිර්මාණය නිසා සිදු වේ. තුන්වන සියවසේ සිට ම විශාල වැව්වල බිසෝ කොටුව භාවිත ව තිබිණි. 'ජලය බස්සවනවා' යන අර්ථය "බිසෝ කොටුව" යන වචනයෙහි ඇත. මෙමඟින් ජලය පාලනය කළ හැකි වූවාක් මෙන් ම මුළුමනින් නවතා දැමීම ද කළ හැකි විය. බිසෝකොටු සතු විසල් දොරපලු දැවෙන් නිමවා තිබූ අතර මේවා එසැවීමට ඇතුන් යොදා ගත් බව සිතිය හැකි ය.

## අරුත් පැහැදිලි කිරීම

| | |
|---|---|
| සර්වඥ | - ලොව සියල්ල දත් උත්තමයා; එනම් බුදුරජාණන් වහන්සේ |
| ගොන්නකින් | - විශාල ප්‍රමාණයකින් |
| කෙනෙහිලිකම් | - කරදර/ හිරිහැර |
| වැව් යුගල | - වැව් දෙක |
| වාන | - වැවේ අතිරික්ත ජලය බැස යාමට සාදා ඇති කපොල්ල |
| නුවර කලාවිය | - නුවර වැව, පදවිය වැව, කලා වැව, යන වැව් තුනෙන් පෝෂිත ප්‍රදේශය නුවර කලාවිය යැයි හඳුන්වයි. |

### අවබෝධය

1. කලා වැවේ ජල කාන්දුව නැවැත්වීමට "කඩවර" නමැති තැනැත්තා කටයුතු කළේ කවර අනතුරක් වළක්වා ගැනීම සඳහා ද?
2. පැරැන්නන් "කඩවර" වෙනුවෙන් දේවාලයක් ඉදි කළේ ඇයි?
3. ධාතුසේන රජතුමා අංග සම්පූර්ණ වාරිමාර්ග පද්ධතියක් සැදුවේ යැයි කිව හැක්කේ ඇයි?
4. ලාංකේය වාරි තාක්ෂණයේ විශිෂ්ටත්වය කියා පාන සාධක මොනවා ද?
5. ලංකාවේ වැව් අතරින් විශිෂ්ටතම "වාන" කලා වැව බව කීමට බලපාන සාධක දෙකක් ලියන්න.

### ප්‍රායෝගික අභ්‍යාස

1. වැව් නිර්මාණය වීමට මුල් වූ ජනප්‍රවාද එකතුවක් සාදන්න.
2. ශ්‍රී ලංකාවේ විශාල වැව් සහ ඒවා පිහිටි ප්‍රදේශ වගු ගත කරන්න.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

3. "ශ්‍රී ලංකාවේ වාරි තාක්ෂණයේ විශිෂ්ටත්වය" මැයෙන් බිත්ති පුවත්පතට ලිපියක් ලියන්න.

## මාතෘකානුකූල රචනා ලිවීම

රචනයක් ලිවීම සඳහා මාතෘකා කිහිපයක් ලබා දුන් විට ඉන් එකක් තෝරා ගත යුතු ය. එසේ තෝරා ගැනීමේදී අවධාරණය කළ යුතු කරුණු කිහිපයකි.

- මාතෘකා කිහිපයක් ලබා දී ඇති විට එක් මාතෘකාවක් මැනවින් සිතා බලා තෝරා ගත යුත්තේ ය.
- මාතෘකාව තෝරා ගැනීමේ දී ඔබ ඉතා ප්‍රිය කරන රසවත් එකක් වීම වැදගත් ය.
- මාතෘකාවට අදාළ ව ලිවීමට තරම් සෑහෙන කරුණු හා දැනුම තිබිය යුතු ය.
- මාතෘකාව ඔබේ දැනුමට සේ ම වාක් කෝෂයට ගැළපෙන්නක් වීම ඉතා වැදගත් ය.

### රචනාව සංවිධානය කර ගැනීම

තෝරාගත් මාතෘකාවට අදාළ ව රචනය ලිවීමට පෙර එකී මාතෘකාව පිළිබඳ ස්ථිර සැලැස්මක් ගොඩ නගා ගත යුතු ය. මෙය රචනාවේ සැලැස්ම නැතහොත් රචනාවේ සැකිල්ල ලෙස නම් කළ හැකි ය. එකී සැකිල්ල සකස් කර ගැනීමට සුදුසු මග පෙන්වීමක් පහත දැක්වේ.

- තෝරාගත් මාතෘකාව පිළිබඳ ගැඹුරින් සිතන්න.
- සැකිල්ලක් සකසා ගන්න.
- මාතෘකාව පිළිබඳ සිතට එන සියලු කරුණු පිළිවෙළකින් තොර ව වෙනත් කොළයක ලියන්න.

එකී කරුණු සැකිල්ලට අනුව පෙළ ගස්වා ගන්න. එහි දී

i. නොගැළපෙන කරුණු,
ii. අසාරවත් කරුණු,
iii. බොළඳ යැයි, නොගැඹුරු යැයි සිතෙන කරුණු,
iv. අදාළ නොවන කරුණු කපා ඉවත් කරන්න.

- ප්‍රධාන අනුකරුණු යටතේ අනුඡේද තීරණය කරන්න.
- එම ඡේද වඩා දීර්ඝ හෝ වඩා කෙටි නොවී සමතුලිත ව ඉදිරිපත් කරන්න.
- රචනාව සංවිධානයේ දී,

i. ප්‍රවේශය හෙවත් ආරම්භය
ii. ශරීරය, මධ්‍යය හෙවත් ස්කන්ධය
iii. අවසානය

යන කරුණු තුන ගැන වැඩි වශයෙන් සැලකිලිමත් වීම වැදගත් ය.

## ප්‍රවේශය

- රසවත් ප්‍රවේශයක් ගැනීම වැදගත් ය.
- උද්ධෘත පාඨයක්, තම මතයක්, විද්වත් මතයක්, ආප්තෝපදේශයක් වැනි කොටසකින් ආරම්භය ලබා ගැනීම එය රසවත් සහ සාර්ථක වීමට හේතු වෙයි.

## ශරීරය, මධ්‍යය හෙවත් ස්කන්ධය

- සාරවත් වැදගත් සේ ම රසවත් කරුණුවලින් පරිපූර්ණ විය යුතු ය.
- ඡේද බෙදා තිබීම වැදගත් ය.
- ප්‍රමාණවත් බව තිබිය යුතු ය.
- ස්වකීය සිතුවිලි ඉදිරිපත් කිරීම වැදගත් වේ.

## අවසානය හෙවත් සමාප්තිය

- රචනයේ ප්‍රවේශය සේ ම අවසානය ද වැදගත් ය.
- අවසානයේ දී මුලින් දැක්වූ කරුණුවල සම්පිණ්ඩනයක් ඉදිරිපත් කළ හැකි ය.
- රචනයේ අවසානය රසවත් ව තිබීම වැදගත් ය.

රචනයක් ලිවීමේ දී නාම පද, ක්‍රියා පද හා නිපාත පද වෙන් කර තිබීම වැදගත් ය. එසේ ම විරාම ලක්ෂණ නිසි පරිදි යොදා තිබීම ද වැදගත් ය.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.